# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,490 - 2026 මැයි මස 22 සිකුරාදා - 2026.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය . . . . . . | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය . . . . . . | — |
| වෙනත් පත්කිරීම් . . . . . . | — |
| පළාත් සභා නිවේදන . . . . . . | 798 |
| අතුරු ව්‍යවස්ථා . . . . . . | — |
| තනතුරු ඇබෑර්තු . . . . . . | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය . . . . . . | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් . . . . . . | — |
| බඩු බාහිරාදිය විකිණීම් . . . . . . | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් . . . . . . | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජුනි මස 12 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 29 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

797 - B 082795 — - (2026/05)
F 1 -

# පළාත් සභා නිවේදන

## නාරම්මල ප්‍රාදේශීය සභාව

### 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තියේ 1 උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් සභාවේ ආණ්ඩුකාරවර තිස්ස කුමාරසිරි වර්ණසූරිය වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙහි සඳහන් කරන සුසාන, මළ මිනී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසාන භූමියක් ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

තිස්ස කුමාරසිරි වර්ණසූරිය,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2026 මාර්තු මස 27 දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගාව,
කුරුණෑගල.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණිය හත්පත්තුවේ උඩුකහ උතුරු කෝරළයේ නාරම්මල බල ප්‍රදේශයේ අංක 1061 වේරගල ග්‍රාම නිලධාරි වසමට ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් සකස් කරන ලද අවසන් ගම් පිඹුරුපත් අංක 244 ට යොමුවන පරිදි, සර්වෙයර් ජනරාල්ගේ අංක KU/NRM/2019/591 හා අතිරේක අංක 6 පත්‍ර අංක 7 හි දක්වා ඇති පී. ඒ. එන්. ගුණසිරි මානක තැන විසින් මැන සකස් කරන ලද 2021.01.31 දින සර්වෙයර් ජනරාල් විසින් අනුමත කරන ලද පිඹුරෙහි උතුරට : 13 කැබැල්ලද, නැගෙනහිරට : 13 B කැබැල්ල ද, දකුණට : 154 සහ 153 බිම් කැබැලි ද, බටහිරට : 12 බිම් කැබැල්ලට ද මායිම් වන (හෙක්ටයාර් 0.03028) රූඩ්. 2 පර්. 39.7 ක් විශාල ඉඩම.

05-254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.